**හපුතලේ නගර සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
**-----------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**
---------------

1.1. **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 08 දින ද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 23 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුනි 25 දින සභාවේ ලේකම්ට යවා ඇත.

1.2 **මතය**
------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට හපුතලේ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
---------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
----------------------

(අ) නාගරික සංවර්ධන අධිකාරියෙන් සභාවට අයවිය යුතු රු.74,824 ක විදුලි ගාස්තුව ණයගැතියන් යටතේ ගිණුම්ගත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයගැතියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම් ගණනය කර ගිණුම්ගත කර නොතිබූ බැවින් වර්ෂයේ ආදායම හා වර්ෂය අවසානයට ණයගැතියන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දී ලැබී තිබුණු රු.451,625 ක් වූ ස්ථාවර තැන්පත් පොලී ආදායම නැවත ආයෝජනය කිරීම ජර්නල් සටහන් අංක 9 හා 10 මගින් ගිණුම්ගත කිරීමේ දී ශේෂ හිලව් වීම නිසා සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම හා වර්ෂය අවසානයට ආයෝජන රු.451,625 බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ ස්ථාවර වත්කම් උපලේඛනවලට අනුව රු.286,550 ක් වූ වත්කම්වල වටිනාකම ගිණුම්ගත නොකිරීම නිසා වර්ෂය අවසානයට ප්‍රාග්ධන යෙදවුමට ආදායමෙන් දායකවීමේ ගිණුම් ශේෂය හා ස්ථාවර වත්කම් ගිණුම් ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුලදී පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් සභාවට ලැබී තිබුණු රු.265,000 ක් වූ බහුකාර්ය ජංගම කුටි 10 ක වටිනාකම ගිණුම්ගත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට වත්කම් වටිනාකම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය රු.265,000 ක් බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි 12 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව තැන්පත් ගිණුමේ ශේෂය රු.7,340,434 ක් වුවද, තැත්පත් ලේඛණය අනුව එය රු.7,499,149 ක් වූයෙන් රු.158,715 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.15,697,837 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.32,399,300 ක් විය.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු.1,176,386 ක් වටිනා ගිණුම් විෂයයන් 02 ක් සඳහා විස්තරාත්මක උපලේඛණ, ශේෂ සනාථ සහතික සහ අදාල අගරු චෙක්පත් හෝ විස්තර ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.5 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 164 වගන්තිය | සංචාරක සංවර්ධන මණ්ඩලය විසින් අනුමත නවාතැන් පලවලින් පෙර වර්ෂයේ ලැබීම්වලින් සියයට 1 ක් නොඉක්මවන මුදලක් අදාල වර්ෂයේ බලපත්‍ර ගාස්තු ලෙස අයකළ යුතු වුවද, සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යන එවැනි නවාතැන්පල 02 කින් එසේ ගාස්තු අයකර ගෙන නොතිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය
------------------------------------

| | |
|---|---|
| මු.රෙ. 371 | සභාව විසින් 1997 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුල අවස්ථා 14 කදී විවිධ පාර්ශවයන් වෙත ගෙවන ලද රු.295,181 ක අත්තිකාරම් පියවා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 1:6 හා 4 වගන්ති | සභාවේ සේවයේ නියුතුව සිට ස්ථාන මාරුවීම් ලැබූ, සේවය හැර ගිය හා මියගිය සේවකයින් 25 දෙනෙකු ගෙන් වසර 03 සිට 18 ක් දක්වා කාලයක සිට අය නොවී පවතින රු.43,576 ක සේවක ණය අයකර ගෙන නොතිබුණි. |
| (ඇ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 චක්‍රලේඛය | i. සභාව සතු කඩ කාමර සඳහා මාසික කුලී, චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව තක්සේරුකර නොගෙන සභාව තීරණය කළ, වෙළඳපල වටිනාකමට නොගැලපෙන අඩු බදු කුලී මුදලක් අයකරමින් පැවතුනි.<br><br>ii. කඩ කාමරයක් බදුගත් බදුකරුවකු සිය කැමැත්තෙන්ම බදු ගිවිසුම අවලංගු කරගන්නා අවස්ථාවක එම කඩ කාමරය සභාව වෙත පවරාගෙන නැවත ටෙන්ඩර් කැඳවා බදුදීමට කටයුතු කළ යුතු වුවද, සභාව විසින් අවස්ථා 09 කදී නැවත ටෙන්ඩර් කැඳවීමකින් තොරව නම් මාරුකිරීමේ ගාස්තුවක් පමණක් අයකරගෙන බදු අයිතිය ලබාදී තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය
----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,954,082 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 9,913,515 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.6,959,433 ක අවාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

## 2.2 ආදායම් පරිපාලනය

---------------------

### 2.2.1 බදු කුලී

--------

සභාව සතු කඩ කාමර 188 කින් 2014 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.3,960,170 ක කඩ කුලී අයකර ගෙන නොතිබුණි.

### 2.2.2 තානායම් කළමනාකරණ ගාස්තු

----------------------------------

නාගරික සංවර්ධන අධිකාරිය මඟින් තානායම පාලනය කළ 1999 සිට 2007 දක්වා කාලයට අදාලව අයවිය යුතු රු.3,974,194 ක තානායම් කුලී සහ තානායම් කළමනාකරු විසින් ගෙවීම් පැහැර හැරීම මත සභාව විසින් පියවන ලද රු.74,824 ක විදුලි ගාස්තු සභාව වෙත අයකරගෙන නොතිබුණි.

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

----------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 217,083 |
| මුද්දර ගාස්තු | 707,569 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

බහුකාර්ය ගොඩනැගිල්ලේ තිබෙන නිල නිවාස 02 ක් සඳහා රු.70,544 ක් වැය කර උපකරණ මිලදී ගෙන තිබුණු අතර, එම නිල නිවාස ඉදිකර වසර 02 කට ආසන්න කාලයක් ගතවී තිබුනද ප්‍රයෝජනයට නොගෙන වසා දමා තිබුණි.

## 4. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය